උතුරු මැද පළාත් සභාව 2023

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

උතුරු මැද පළාත් සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 29 දින නිකුත් කරන ලද අතර, ජාතික විගණන පනතේ 11(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජුනි 19 දින නිකුත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙතද, වාර්තාවේ පිටපත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාරව පළාත් සභාව ඉදිරියේ තැබීම සඳහා ආණ්ඩුකාරවරයා වෙතද ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා වන පදනම ඡේදයෙහි දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර උතුරු මැද පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට උතුරුමැද පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු ගිණුම් අනුව නොනිමි වැඩ වටිනාකම රු.5,959,447,473 ක් වුවත්, පළාත් සභා අරමුදල් ගිණුමේ සටහන 7.1 ප්‍රකාරව එම අගය රු.2,380,490,208 ක් වූයෙන් රු.3,578,957,265 ක නොනිමි වැඩ අඩුවෙන් පළාත් සභා අරමුදල් ගිණුමේ ගිණුම්ගත කර තිබුණි. | පළාත් සභා මූල්‍ය ප්‍රකාශන සඳහා ජංගම නොවන වත්කම් ඇතුළත් කිරීමේදී වත්කම් කළමනාකරණ මෘදුකාංගය භාවිතා කරන අතර, එම මෘදුකාංගයේ 2104 වැය සංකේතය යටතේ දරන ලද වියදම් ඇතුළත් වී නැත. මේ පිළිබඳ චක්‍රලේඛයක් නිකුත් කර ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුව වත්කම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුයි. |
| (ආ) | පළාත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු ගිණුම්වල සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නොනිමි වැඩ වටිනාකම ලෙස දැක්වෙන රු.5,959,447,473 ක වටිනාකම තුළ අඩංගු එකතු වටිනාකම රු.178,507,592 ක ඉදිකිරීම් ව්‍යාපෘති 40 ක් සමාලෝචිත වර්ෂය තුළ අවසන් කර භාවිතයට ගත හැකි තත්ත්වයට පත්කර ඒ ඒ අමාත්‍යාංශ දෙපාර්තමේන්තු වෙත භාරදී තිබූ නමුත්, එම වත්කම් නොනිමි වැඩ ගිණුම්වලින් ගොඩනැඟිලි හා ඉදිකිරීම් ගිණුම්වලට මාරුකර නොතිබීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් ගොඩනැගිලි හා ඉදිකිරීම් වටිනාකම අඩුවෙන් දැක්විණි. | ප්‍රධාන අමාත්‍යාංශ සහ අනෙකුත් ආයතනවල නොනිමි වැඩ වියදම් ලෙස කපා හැරීම නිසා මෙම වරද සිදුව ඇත. සියලු ආයතන වෙත චක්‍රලේඛයක් මඟින් උපදෙස් දී ඇති අතර ඉදිරියේදී නිවරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුව වත්කම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුයි. |
| (ඇ) | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ආයෝජන පොලිය රු.206,371,837 ක් දක්වා තිබුණද, විගණනයේදී සිදු කළ ගණනය කිරීම් අනුව එය රු.207,816,902 ක් වූයෙන් රු.1,445,065 ක වෙනසක් නිරීක්ෂණය විය. | විගණනයේදී සිදුකරන ලද ගණනය කිරීම නිවැරදි වන අතර, 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදි අගයන්ට අනුව මූල්‍ය ප්‍රකාශන සැකසිය යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | උතුරු මැද පළාත් භාණ්ඩාගාරය විසින් පළාත් පාලන ආයතන වෙත 2023 දෙසැම්බර් 31 දිනට ප්‍රේෂණය කළ යුතු මුද්දර ගාස්තු සහ උසාවි දඩ පිළිවෙලින් රු.19,542,031 ක් සහ රු.227,811,612 ක් 2023 දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාත් සභා අවසන් ගිණුමේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් යටතේ දක්වා නොතිබුණි. | පළාත් භාණ්ඩාගාරයේ පාලන ගිණුම් අනුව එක් එක් පළාත් පාලන ආයතන වෙත උසාවි දඩ හා මුද්‍රණ ගාස්තු නිදහස් කරනු ලබයි. 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී මීට අදාළ හෙළිදරව් කිරීම් සිදු කිරීමට කටයුතු කරමි. | දෙසැම්බර් 31 දිනට පළාත් සභා අරමුදල සම්බන්ධයෙන් ඇති සියලු බැරකම් අනාවරණය කළ යුතුය. |

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරීත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව උතුරු මැද පළාත් සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාත්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.
- අවස්ථාවෝචිත උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ අභ්‍යන්තර පාලනය සැලකිල්ලට ගන්නා නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

## 1 .5 මූලාා ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.5.1 ශීර්ෂය 600 - ආණ්ඩුකාරවර ලේකම් කාර්යාලය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------ | ---------------------------------- | ------------ |
| (අ) | ගරු ආණ්ඩුකාරතුමා අනුමත කර ඇති පළාත් රාජා සේවාවේ වාර්ෂික ස්ථානමාරු පටිපාටිය ප්‍රකාරව එක් සේවා ස්ථානයක වසර 5 කට වැඩි සේවා කාලයක් ඇති නිලධාරීන් ස්ථානමාරු කළ යුතු වුවත්, ඒකාබද්ධ රියදුරු සේවයේ නිලධාරීන් 52 ක් කළමනාකරණ සේවයේ නිලධාරීන් 24 ක් සහ සංවර්ධන නිලධාරීන් 14 ක් ලෙස නිලධාරීන් 90 දෙනෙකු සම්බන්ධයෙන් වාර්ෂික ස්ථානමාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කර නොතිබුණි. | මෙම වර්ෂයේ වාර්ෂික ස්ථාන මාරු ලබාදීමේදී මෙම නිලධාරීන් පිළිබඳ විශේෂ අවධානයක් යොමුකර අදාළ සේවා ආයතන වෙත ස්ථාන මාරු ලබාදීමටත් රියදුරු සේවයේ ස්ථානමාරු සම්බන්ධයෙන් ගරු ආණ්ඩුකාරතුමන් විමසා එතුමාගේ තීරණය පිළිබඳ සාකච්ඡාකර ඉදිරි කටයුතු කිරීමටත් අදහස්කර ඇති බව කාරුණිකව වාර්තා කරමි. | කාර්යය පටිපාටිය අනුව කටයුතු කළ යුතුයි. |
| (ආ) | රජයේ නියාමනයට යටත් නොවන කිසිඳු සහන ගාස්තු ක්‍රමයක් නොමැතිව ක්‍රියාත්මක වන හොරිවිල වෙද ගෙදර වාට්ටු සංකීර්ණය ඉදිකිරීම සඳහා ආණ්ඩුකාර ලේකම් කාර්යාලය විසින් ප්‍රමුඛ සංවර්ධන අවශ්‍යතා සහිත විශේෂ සංවර්ධන වැඩසටහන 2021 යටතේ රු.5,193,756 ක් වියදම් දරා තිබූ අතර, එම ව්‍යාපෘතිය සඳහා රජයේ ප්‍රතිපාදන ලබාදීම කුමන පදනමකින් සිදු කරන ලද්දේද යන්න පැහැදිළි නොවුණි. | ආණ්ඩුකාරතුමා වෙත ඉදිරිපත්වන ඉල්ලීම් අනුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇත. | මුදල් කොමිෂන් සභාව ප්‍රතිපත්තිමය එකඟතාවය ලබාදුන් පළාත් සංවර්ධන සැලැස්ම තුළ ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුයි. |

**1.5.2 ශීර්ෂය 610 - ප්‍රධාන අමාත්‍ය හා උතුරුමැද පළාත් නීතිය හා සාමය, මුදල් හා ක්‍රම සම්පාදන, පළාත් පාලන,ග්‍රාමීය යටිතල පහසුකම් හා විශේෂ ව්‍යාපෘති, සංචාරක,අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ, ඉංජිනේරු ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කළ ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ගෙවීමේදී රඳවාගත් එකතුව රු.100,685,039 ක් වූ අතරුදවුම් මුදල් වසර 02 ක් ඉක්මවා තිබියදී, එම මුදලින් අදාළ ඉදිකිරීම්වල අඩුපාඩු පවතී නම් යථාවත් කරගැනීම හෝ එම තැන්පත් රජයේ ආදායමට ගැනීමට කටයුතු නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | මුදල් රෙගුලාසි 572 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | පොළොන්නරුව පොදු වෙළඳ සංකීර්ණයේ ඉතිරි වැඩ නිම කිරීමේ ව්‍යාපෘතිය 2019 ඔක්තෝබර් 15 දින අවසන් කර භාර දී තිබූ අතර, එම ඉදිකිරීම්වල පැවති අඩුපාඩු නොසලකා රු.16,745,178 ක අවසන් බිල්පත් ගෙවා තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.6 ඡේදය ප්‍රකාරව කොන්ත්‍රාත්තුව වෙනුවෙන් රඳවාගෙන තිබූ රු.6,655,599 ක රුඳවුම් මුදල්, වාණිජ බැංකු ඇපකරයක් මත නිදහස්කර තිබූ නමුත් ව්‍යාපෘතියේ පැවති අඩුපාඩු අතරුදවුම් කාලය තුළද නිවැරදි කර නොතිබුණු අතර, අදාළ බැංකු ඇපකරයේ කාලයද ඉකුත්වීම හේතුවෙන් එම මුදලින් අඩුපාඩු නිවැරදිකර ගැනීමටද අපොහොසත් වී තිබුණි. | නඩත්තු කාලය තුළ දෝෂ ඇත්නම් ඒ පිළිබඳ වාර්තා කරන ලෙස මාගේ සමාංක NCP/CM/EDU/08/02/100-2017 හා 2022/01/20 දිනැති ලිපිය මගින් ව්‍යාපෘති භාර ඉංජිනේරු දැනුවත් කළද ඔහු විසින් අතරුදවුම් නිදහස් නොකරන ලෙස නිර්දේශ ලබා දී නැති බවද කාරුණිකව දන්වමි. මේ පිළිබඳ ප්‍රධාන අමාත්‍යාංශයේ හිටපු ප්‍රධාන ගණකාධිකාරීගේ සභාපතිත්වයෙන් 2024/03/08 දින කමිටුවක් පත්කර ඇත. එහි නිර්දේශ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. | ඉදිකිරීම්වල පැවති අඩුපාඩු කඩිනමින් නිවැරදි කර දීමට කටයුතු කළ යුතු අතර, රුඳවුම් මුදල් සඳහා ලබාගත් බැඳුම්කරයේ කාලය ඉකුත් වීමට ඉඩ හරින ලද නිලධාරීන්ගෙන් එම මුදල අය කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | හබරණ සංචාරක තොරතුරු මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා රු.598,013,000 ක මුදලකට ගිවිසුම් ගත වූ සමාගම ව්‍යාපෘතිය අඩක් නිමකර රු.369,171,165 ක ගෙවීම් ලබාගෙන ව්‍යාපෘතිය නවතා දමා තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා රු.119,602,600 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලබාදී තිබුණි. ව්‍යාපෘතිය ඉදිකිරීම නවතා වසර 06 ක් ඉක්මවා ගතවී ඇතත්, ලබාදුන් අත්තිකාරම් මුදලින් තවදුරටත් අයකරගත යුතුව පැවති රු.45,171,484 ක් විය. අත්තිකාරම් සඳහා ලබාගත් අත්තිකාරම් සුරක්ෂණ බැඳුම්කරය කල් ඉකුත් වී තිබුණි. ව්‍යාපෘතිය සම්පූර්ණ කර භාවිතයට ගැනීමට හැකි තත්ත්වයට පත්කිරීමට අපොහොසත් වීම හේතුවෙන් මේ දක්වා දැරූ රු.369,171,165 ක මුදල නිෂ්කාර්යය වියදමක් බවට පත්වී තිබුණි. කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කරන ලද 12 වන අතුරු බිල්පතින් වැඩබිමේ ඇති ඉදිකිරීම් ද්‍රව්‍ය වෙනුවෙන් රු.11,611,385 ක් ගෙවා තිබූ නමුත්, 2023 දෙසැම්බර් 15 දිනවන විට එවැනි වටිනාකමට අදාළ ද්‍රව්‍ය වැඩබිම තුළ නොතිබුණි. | රටතුළ පැවති ආර්ථික අර්බුදය හා කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් මේ සඳහා අවශ්‍ය මුදල් මධ්‍යම රජය වෙතින් ලබා ගැනීමට නොහැකිවීම හේතුවෙන් මෙම ව්‍යාපාරය නැවතී ඇත. ව්‍යාපෘතිය ප්‍රමාණාත්මකව කුඩාකර හෝ අවම මුදලක් වැයකර ඉදිරි වර්ෂය තුළදී නිම කිරීමට අපේක්ෂිතය. | ඵලදායි ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුයි. |

**1.5.3 උතුරුමැද පළාත් සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය**

| | විගණන නිරීක්ෂණය | ආයතනයේ සභාපතිගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1990 අංක 11 දරන සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය පිහිටුවීම පිළිබඳ ප්‍රඥප්තිය අනුව එහි අධ්‍යක්ෂ මණ්ඩලය අමාත්‍යවරයා විසින් ස්වභිමතානුකූලව | 1990 අංක 11 දරන සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය පිහිටුවීම පිළිබඳ වූ ප්‍රඥාප්තිය අනුව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් තිදෙනෙකුගෙන් | ප්‍රඥප්තිය සංශෝධනය කර රාජ්‍ය ව්‍යවසාය පාලනය සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | පත් කරන ලද පුද්ගලයින් 03 දෙනෙකුගෙන් සමන්විත වූ නමුත්, ඒ සඳහා පළාත් අමාත්‍යාංශයේ නියෝජිතයෙකු හා පළාත් භාණ්ඩාගාරයේ නියෝජිතයෙකු ඇතුළත්ව නොතිබුණි. | සමන්විත වේ. එය සභාපති, කළමනාකාර අධ්‍යක්ෂක සහ තවත් එක් සාමාජිකුගෙන් සමන්විත වේ. මෙම තිදෙනා විෂයභාර ගරු ප්‍රධාන අමාත්‍යවරයා විසින් ප්‍රඥාප්තියේ විධිවිධාන අනුව පත්කර ඇත | |
| (ආ) | ඒජන්සියේ වාහන අලුත්වැඩියා අංශය විසින් සමාලෝචිත වර්ෂයේ සහ ඊට පෙර වර්ෂයේ රු.45,555,467 ක අමතර කොටස් මිලදීගෙන තිබුණේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව තරඟකාරී මිල ගණන් කැඳවීමකින් තොරව විය. | වාහන අලුත්වැඩියා කටයුතු සිදු කිරීමේ දී එක් එක් මාදිලිවලට අදාළ වාහන වර්ගවලට අමතර කොටස් මිලදී ගැනීම සඳහා අනුගමනය කළ යුතු ප්‍රසම්පාදන ක්‍රමවේදයක් සකස් කර NCP/DCMA/AD/අ.ම/මි.ක/23(254) අංක යටතේ උතුරුමැද ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදි. | ආයතනයට සුදුසු ප්‍රසම්පාදන ක්‍රමවේදයන් සකස්කර, අනුමතකරවා ගෙන තරඟකාරී මිල මත අමතර කොටස් මිලදී ගැනීම කළ යුතුයි. |

**1.5.4 ශීර්ෂය 611 - පළාත් පාලන දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | ------------------------- | ------------------ |
| (අ) | සංවර්ධන ව්‍යාපෘති 04 ක් සඳහා ගිවිසුම් ගත වූ කොන්ත්‍රාත්කරුවන් ව්‍යාජ කාර්යසාධන ඇපකර හා ව්‍යාජ අත්තිකාරම් ඇපකර ඉදිරිපත්කර කාර්යසාධන අත්තිකාරම් ලබාගෙන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පැහැර හැරීම හේතුවෙන් රු.2,452,328 ක අත්තිකාරම් ආපසු අයකර ගැනීමට නොහැකි වී ඇති අතර, එම ව්‍යාජ බැඳුම්කර ඉදිරිපත්කර තිබූ කොන්ත්‍රාත්කරුවන් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙමඟින් සිදුවී ඇති අලාභය මේ වන විට අදාළ නිලධාරීන් ගෙන් අයකර ගැනීමට කටයුතු කර ඇති බව දන්වා සිටින අතර, මෙම කොන්ත්‍රාත්කරු අසාධු ලේඛන ගත කිරීමට කටයුතු කර ඇති බව වැඩිදුරටත් දන්වා සිටිමි. | පළාත් මූල්‍ය රීති 433.1 ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2021 පෙබරවාරි 26 දිනැති හා අංක 393(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව රැස්වීම්, සම්මන්ත්‍රණ හා වැඩමුළු හෝටල්වල පැවැත්වීමට ඉඩ නොදෙන ලෙස දන්වා තිබුණද, ඊට පටහැනිව උතුරු මැද පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් වැඩමුළු 02 ක් හෝටල්වල පවත්වා තිබුණු අතර, ඒ සඳහා රු.1,248,850 ක වියදමක් දරා තිබුණි. | නිලධාරීන් 60 කට අධික ප්‍රමාණයක් සහභාගීවීමට නියමිත වූ බැවින් ද, එම වැඩමුළුව ප්‍රායෝගික හා කණ්ඩායම් ක්‍රියාකාරකම් ආශ්‍රයෙන් සිදුකළ බැවින්ද, අවම මිල ගණන් යටතේ නගරාසන්න හෝටලයක් තොරාගන්නා ලදී. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |
| (ඇ) | පළාත් පාලන දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක කරන ලද විද්‍යුත් පුස්තකාල ගොඩනැගිලි ඉදිකිරීම් 45 න් ඉදිකිරීම් ගොඩනැගිලි 26 කම ඉදිකිරීම් අතහැර දමා තිබුණි. අතරමග නවතා දැමූ එම ව්‍යාපෘති වෙනුවෙන් රු.21,951,953 ක් සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණි. | එවකට රටේ පැවති භාණ්ඩ හිඟය, අධික ලෙස භාණ්ඩවල මිල ඉහළ යාම හා අයහපත් කාලගුණ තත්ත්වය යන කරුණු මත ඇතැම් සමිති මෙම කටයුත්තෙන් ඉවත් වී ඇති අතර, මුදල් අමාත්‍යාංශය නිකුත් කළ ජාතික අයවැය චක්‍රලේඛය 03/2022 අනුව දෙපාර්ශවයේ එකඟතාවයෙන් කොන්ත්‍රාත් ගිවිසුම අවසන්කරන ලෙස දන්වා ඇත. | අපේක්ෂිත අරමුණු ඉටුවන ආකාරයට ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුයි. |
| (ඇ) | පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ රු.83,197,267 ක් වියදම් දරා ඉදිකර සම්පූර්ණයෙන්ම වැඩ අවසන් කළ විද්‍යුත් පුස්තකාල ගොඩනැඟිලි 16 ක් අනුමත කාර්යයට භාවිතා නොකොට වෙනත් කටයුතු සඳහා ලබාදී තිබුණි. | අඩුපාඩු පවතින බැවින් හා ප්‍රමාණවත් මුදල් ප්‍රතිපාදන අරමුදලේ නොමැති බැවින් වෙනත් සංවර්ධන යෝජනා සඳහා ඉදිරිපත් කර ඇත. | යෝජිත ක්‍රියාකාරකම් ආරම්භ කළ යුතුවේ. |
| (ඉ) | භාණ්ඩ, වැඩ හෝ සේවා කොන්ත්‍රාත්වලදී අදාළ කාර්යයන් නිමකර භාරදීමට පෙර අත්තිකාරම් ලබා | පළාත් මූල්‍ය රීති 146.2 යටතේ විශේෂ අවස්ථාවලදී ගෙවීමක් ලෙස අනුමත කර මෙම ගෙවීම | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු අතර, මාර්ගගත ක්‍රමයට |

| | | | |
|---|---|---|---|
| | දෙන්නේ නම් අත්තිකාරම් සුරක්ෂණයක් ලබාගෙන මුළු කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 30 ක් අත්තිකාරම් ගෙවිය හැකි වුවද, පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් පළාත් පාලන ආයතන 14 ක මාර්ගගත ගෙවීම් සඳහා පරිගණක මෘදුකාංගය සකස් කර ස්ථාපිත කිරීම සඳහා වූ ව්‍යාපෘතියට එවැනි සුරක්ෂණයක් රහිතව වටිනාකම රු.16,186,800 කින් සියයට 50 ක් වූ රු.8,093,400 ක අත්තිකාරම් මුදලක් වයඹ සංවර්ධන අධිකාරියට ලබා දී තිබුණි. | සිදු කර ඇත. මාර්ගගත ක්‍රමයට ගෙවීමේ පහසුකම වයඹ සංවර්ධන අධිකාරිය විසින් සපයා දී ඇති අතර, එය ක්‍රියාත්මක කිරීමේදී බැංකුව මඟින් සිදුවූ යම් ප්‍රමාදයක් හේතුවෙන් එය ක්‍රියාත්මක වීම ප්‍රමාද වී ඇත. | ගෙවීම් ක්‍රමය කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුයි. |
| (ඊ) | පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් රෝද පුටු මිලදී ගැනීම සඳහා සිදුකරන ලද ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී සුදුසුකම්ලත් අවම මිල සහිත ලංසුකරු ඉදිරිපත් කර තිබූ ලංසු ලියකියවිලිවල පිරිවිතර ඇතුළත් ලේඛන ප්‍රසම්පාදන ක්‍රියාවලියට සම්බන්ධ වූ යම් පාර්ශවයක් විසින් ඉවත්කර එම ලංසුකරු, ලංසු ඇගයීමේ ක්‍රියාවලියෙන් ඉවත් කර ඊට වඩා රු.256,100 ක වැඩි මිල ගණන් ඉදිරිපත් කරන ලද ලංසුකරුට ටෙන්ඩරය පිරිනමා තිබුණි. | අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ ආයතනය විසින් සම්පූර්ණ ලියවිලි ඉදිරිපත්කර තිබූ බැවින් දෙවනුව අවම ලංසුව මිලදී ගත් සැපයුම්කරුවන්ගෙන් මිලදී ගෙන තිබුණි. | ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී සිදුවූ අක්‍රමිකතා හඳුනාගැනීම සඳහා විධිමත් පරීක්ෂණයක් සිදු කළ යුතුයි. |

**1.5.5 ශීර්ෂය 612 - පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය<br>---------------------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම්<br>--------------------------------------- | නිර්දේශය<br>------------ |
|---|---|---|---|
| (අ) | 2018 මැයි 24 දිනැති අංක 07/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව විශ්‍රාම වැටුප් ලිපිගොනුව නිවැරදිව සකස් කර අදාළ නිලධාරියා විශ්‍රාම ගන්වන දින හෝ ඊට පසු සතියක් ඇතුළත අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත යොමු කිරීමට කටයුතු කළ යුතු වුවත්, උතුරු මැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් ගුරුභවතුන් 371 කගේ විශ්‍රාම වැටුප් ලිපිගොනු එපරිදි නියමිත කාලය තුළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත යොමු කිරීමට කටයුතු කර නොතිබුණි. | නියමිත දිනවල ලිපිගොනු සකස්කර ඉදිරිපත් කිරීමට නිලධාරීන්ට උපදෙස් දී ඇත. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛනයට අනුකූලව කටයුතු කළ යුතුයි. |
| (ආ) | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අයත් පාසල් 816 න් 2023 වර්ෂයේ දී කොට්ඨාශ හා කලාප කාර්යාල මඟින් පාසල් 520 ක් අධීක්ෂණය කර තිබුණු අතර, එයින් සියයට 31 ක් වූ පාසල් 165 ක ගුණාත්මක දර්ශක අගය එහි තිබිය යුතු ප්‍රසස්ථ මට්ටම වූ සියයට 60 ට වඩා අඩු මට්ටමක පවතින බව නිරීක්ෂණය විය. | මාර්ගෝපදේශනයේ ප්‍රගතිය අවමවීම කෙරෙහි විවිධ හේතු බලපෑ බවත් සඳහන් කර ඇති අතර, ගුණාත්මක දර්ශකය ගණනය නොකරන ලද පාසල් සඳහා ශිෂ්‍ය කාර්යසාධනය ඉලක්ක කරගනිමින් විවිධ දිරිගැන්වීම් ලබා දී ඇති අතර, ගුණාත්මක දර්ශකය අඩු පාසල් කෙරෙහි විවිධ ක්ෂේත්‍රයන් ඔස්සේ වැඩි අවධානයක් යොමු කරමින් 2024 වර්ෂයේදී ගුණාත්මක තත්ත්වය ඉහළ නැංවීමට කටයුතු කරන බව සටහන් කර ඇත. | මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |
| (ඇ) | ළඟම පාසල හොඳම පාසල වැඩසටහන යටතේ ප්‍රධාන අමාත්‍යාංශය ක්‍රියාත්මක කළ ගිවිසුම්ගත වටිනාකම රු.35.536,852 ක් වූ ව්‍යාපෘති 02 ක ඉදිකිරීම් කටයුතු | කාර්යසාධන සුරක්ෂණ දීර්ඝ කිරීම සඳහා කොන්ත්‍රාත්කාර ආයතන වෙත දැන්වුවද, එම ආයතන සඳහා 2017 වර්ෂයේ හා 2018 වර්ෂවල | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | කොන්ත්‍රාත්කරු විසින් අතරමඟ නවතා දමා අතහැර ගොස් ඇති අතර, ඒ වන විට ගිවිසුම් ප්‍රකාරව ඉදිරිපත් කර තිබූ කාර්යසාධන සුරක්ෂණයේ කාලය ඉකුත් වී තිබීම හේතුවෙන් රු.1,777,000 ක වටිනාකමැති කාර්යසාධන සුරක්ෂණ 02 ක් අදාළ මූල්‍ය ආයතනවලට ඉදිරිපත් කර මුදල් කර ගැනීමට අපොහොසත් වී තිබුණි | ගෙවිය යුතු බිල්පත් අමාත්‍යාංශය මඟින් නොගෙවීම නිසා එම කොන්ත්‍රාත්කාර ආයතන වලට මූල්‍ය දුෂ්කරතා ඇති බවත්, එම නිසා අදාළ සුරක්ෂණ දීර්ඝ කිරීම සඳහා හැකියාවක් නොමැති බව ආණ්ඩුකාරතුමන් වෙත දන්වා බිල්පත් ගෙවන තෙක් සුරක්ෂණ දීර්ඝ කර නොගන්නා ලෙස අනුමැතිය ලබා ගෙන ඇත. | |
| (ඉ) | 2017 වර්ෂය තුළදී පලුගස්දමන මහා විද්‍යාලය සඳහා ශ්‍රවනාගාරයක් ඉදිකිරීම වෙනුවෙන් ගිවිසුම්ගත වටිනාකම රු.542,019,300 ක් වූ මුදලකට ඉදිකිරීම් සමාගමක් සමඟ ගිවිසුම් ගත වී රු.100,000,000 ක් අත්තිකාරම් මුදලක් කොන්ත්‍රාත්කරුට ලබාදී තිබූ නමුත් ආරම්භක අවස්ථාවේදීම ඉදිකිරීම් නවතා ව්‍යාපෘතිය අතහැර දමා තිබුණි. කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත්කළ රු.100,000,000 ක අත්තිකාරම් සුරක්ෂණය කල් ඉකුත්වී ඇති අතර ලබාදුන් අත්තිකාරම් මුදල ආපසු අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග කිසිවක් ගෙන නොතිබුණි. | මේ පිළිබඳ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) විසින් පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (ගොඩනැගිලි) ප්‍රධානත්වයෙන් කමිටුවක් 2024/01/10 දින පත් කර විමර්ශනයක් ආරම්භ කර ඇත. එම කමිටුව මඟින් අත්තිකාරම් අයකර ගැනීම හා ගිවිසුම අන්‍යෝන්‍ය එකඟතාවය මත අවසන් කිරීම පිළිබඳ නිර්දේශ ලබා ගැනීමට කටයුතු කර එම නිර්දේශ මත ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. මෙම ව්‍යාපෘතිය සඳහා රු.මි.92 ක බිල්පත් මේ වන විට කොන්ත්‍රාත්කරුවන් විසින් ඉදිරිපත් කර ඇත. | ප්‍රතිපාදන නොමැතිව ගිවිසුම්ගත වූ නිලධාරීන්ට එරෙහිව කටයුතු කළ යුතු අතර හිඟ අත්තිකාරම් මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුයි. |
| (ඊ) | ළඟම පාසල හොඳම පාසල වැඩසටහන යටතේ සහ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ රු.140,596,776 ක් වැය කර අඩක් ඉදි කරන ලද ව්‍යාපෘති 20 ක් වැඩ අවසන් කර නොමැති වීමෙන් එම ව්‍යාපෘති සඳහා දරන ලද එකතුව රු.140,596,776 ක වියදම නිෂ්කාර්ය බව නිරීක්ෂණය විය. එකී | 2019 වර්ෂයේ හා 2021 වර්ෂයේ පැවති කොවිඩ් 19 වසන්ගතය හා 2021 වර්ෂයෙන් පසුව රට තුළ ඇති වූ ආර්ථික අර්බුදය මත වැඩ අවසන් කිරීමට නොහැකි වූ කොන්ත්‍රාත් සඳහා දැනට ආර්ථික තත්ත්වය යහපත් මට්ටමට හැරමින් පවතින | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | ඉදිකිරීම් කොන්ත්‍රාත් 06 කට අදාළ තවදුරටත් අයවිය යුතු අත්තිකාරම්වල වටිනාකම රු.36,881,569 ක් විය. | නිසා වැඩ අවසන් කිරීමට කටයුතු කරන ලෙස ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් වෙත උපදෙස් ලබා දී ඇත. | |
| (උ) | ජාතික මට්ටමින් පාසල් ශිෂ්‍යයන් සඳහා පවත්වනු ලබන විභාග වලට පෙනී සිටි උතුරු මැද පළාතේ දරුවන්ගේ ප්‍රතිඵල විශ්ලේෂණය කිරීමේදී පහත කරුණු නිරීක්ෂණය විය<br>i. අ.පො.ස (සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල අනුව 2017 වර්ෂය දක්වා 06 වන ස්ථානයේ පැවති උතුරු මැද පළාත 2021 හා 2022 වර්ෂයේදී 09 වන ස්ථානයට පත් වී තිබුණි.<br>ii. අ.පො.ස.(උ.පෙළ) විභාගයේ ප්‍රතිඵල අනුව 2017 වර්ෂයේදී 08 වන ස්ථානයේ පැවති උතුරුමැද පළාත 2021 සහ 2022 වර්ෂ වනවිට 09 වන ස්ථානයට පත්වී තිබුණි.<br>iii. 2021 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා 5 වසර ශිෂ්‍යත්ව විභාගයේදී ලකුණු 100 කට වඩා ලබා ගැනීම අනෙකුත් පළාත් වල ප්‍රතිඵල සමඟ සංසන්දනය කිරීමේදී උතුරු මැද පළාතට පිළිවෙලින් 5, 6, 6 වන ස්ථාන හිමි වී තිබුණි. එලෙස 100 ට වැඩි ලකුණු ලබාගත් ළමුන්ගේ ප්‍රතිශතය වසර 03 ක දීම සියයට 50 සීමාවට ළගා වී නොතිබුණි. | විවිධ වැඩසටහන් මඟින් ප්‍රතිඵල ඉහළ නැංවීම සඳහා ක්‍රියාමාර්ග රාශියක් ගෙන ඇත. විශේෂයෙන් ගුරු හිඟය මේ සඳහා ප්‍රධාන වශයෙන් බලපා ඇත. | ප්‍රතිඵල ඉහළ නැංවීම සඳහා කඩිනම් වැඩ පිළිවලක් සැකසිය යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ඌ) | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අයත් කලාප අධ්‍යාපන කාර්යාලවල සිංහල මාධ්‍යය පාසල්වල විෂයයන් අනුව ගුරු පුරප්පාඩු 3578 ක් හා අතිරික්තතා 403 ක් ද, දෙමළ මාධ්‍යය පාසල්වල විෂයයන් අනුව ගුරු පුරප්පාඩු 641 ක් හා අතිරික්තතා 128 ක්ද, ඉංග්‍රීසි මාධ්‍යය පාසල්වල විෂයයන් අනුව ගුරු පුරප්පාඩු 39 ක් හා අතිරික්තතා 08 ක්ද සමාලෝචිත වර්ෂය අවසානයට පැවතුණි. | පිළිතුරු දී නොමැත. | පළාත තුළ ගුරු මණ්ඩලය කළමනාකරණය කර ගුරු පුරප්පාඩු අවම වන සේ කටයුතු කළ යුතුයි. |
| (එ) | අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා නියමිත කාලය තුළ උසස්වීම් හා වැටුප් වර්ධක ලබා දීමට නිශ්චිත වැඩපිළිවෙලක් සකසා නොතිබීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට පාසල්වල සේවය කරන ගුරුභවතුන් 2,280 කගේ හිඟ වැටුප් රු.120,556,983 ක් හා ගුරුභවතුන් 96 කගේ හිඟ දීමනා රු.6,575,288 ක් ගෙවිය යුතුව පැවතිණි. | පිළිතුරු දී නොතිබුණි | නියමිත කාලය තුළ වැටුප් වර්ධක හා උසස් වීම් ලබාදීමට වැඩපිළිවලක් සැකසිය යුතු වේ. |
| (ඒ) | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අයත් පාසල්වල විවිධ විෂයයන් සඳහා ගුරුභවතුන් ගේ පුරප්පාඩු පැවතියදී ගුරුභවතුන් 34 දෙනෙකු මාස 06 සිට වසර 27 ක් දක්වා කාලයක් වෙනත් ආයතනවලට මුදාහැර තිබුණු අතර එම මුදාහල ගුරුභවතුන් 30 ක් සඳහා මුදාහල දින සිට 2023 දෙසැම්බර් 31 දක්වා අදාළ නිලධාරීන් සේවයට වාර්තා කිරීම්, පැමිණීම් හා පිටවීම් වාර්තා, නිවාඩු වාර්තා සහ මුදාහල ආයතනය වලින් ලබාගත් දීමනා පිළිබඳ වාර්තා තහවුරු කර ගැනීමකින් තොරව කලාප අධ්‍යාපන කාර්යාල විසින් වැටුප් හා දීමනා වශයෙන් රු.85,838,643 ක් ගෙවා තිබුණි. | සක්‍රීය සේවයෙන් මුදාහැර ඇති ගුරුවරුන් සම්බන්ධයෙන් කටයුතු කල යුතු ආකාරය ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ NCP/CM/EDU/04/01/01yd 2022/12/14 දිනැති ලිපිය මඟින් අදාළ ආයතන වෙත උපදෙස් දී ඇත. | වෙනත් ආයතනවලට මුදාහැර ඇති කාර්ය මණ්ඩලවලට වැටුප් ගෙවීමේදී ඔවුන්ගේ සේවයට පැමිණීම හා නිවාඩු විස්තර ලබා ගැනීම සිදු කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| (ඕ) | ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 11.2.3 උප වගන්තිය ප්‍රකාරව පරිවාසය පිට සිටින නිලධරයෙකුගේ පරිවාස කාලය අවසන්වීමේදී ඔහු සේවයෙහි ස්ථිර කිරීමට හෝ ඔහුගේ පරිවාස කාලය දීර්ඝ කිරීමට හෝ පරිවාස පත්වීම් අවසන් කිරීමට හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා වග බලා ගත යුතු වුවත්, උතුරු මැද පළාත තුළ පිහිටි පාසැල් වල 1990 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයේ ගුරු සේවයට පත්වීම් ලැබී තිබුණු ගුරුභවතුන් 137 කගේ සේවය ස්ථිර කිරීමට 2023 දෙසැම්බර් 31 වන විටද කටයුතු කර නොතිබුණි. | සේවය ස්ථිර කර නොමැති ගුරුවරුන්ගේ සේවය ස්ථිර කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී | ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 11.2.3 උප වගන්තිය ප්‍රකාරව පරිවාසය පිට සිටින නිලධාරියෙකුගේ පරිවාස කාලය අවසන්වීමේදී ඔහු සේවයෙහි ස්ථිර කිරීමට හෝ ඔහුගේ පරිවාස කාලය දීර්ඝ කිරීමට හෝ පරිවාස පත්වීම් අවසන් කිරීමට හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා වග බලා ගත යුතුය. |
| (ඖ) | උතුරු මැද පළාත තුළ පාසැල් 258 කට ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන් අනුයුක්ත නොකර ගුරු සේවයට අයත් ගුරුවරුන්ට විදුහල්පති තනතුරේ රාජකාරි ඉටු කිරීමට වැඩ බලන තනතුරු ලබා දී තිබුණු නමුත්, පාසල් 397 ක ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන් නියෝජ්‍ය විදුහල්පති තනතුරේ රාජකාරි ඉටු කරන බව නිරීක්ෂණය විය. | මෙම තත්ත්වය නිවැරදි කිරීමට කටයුතු කරන ලෙස පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත උපදෙස් ලබා දී ඇත. | විදුහල්පති සේවය සමත් ගුරුභවතුන් සඳහා විදුහල්පති තනතුරු ලබාගත යුතුය |

### 1.5.6 ශීර්ෂය - 620 පළාත් කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ව නිෂ්පාදන හා සත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු අමාත්‍යාංශය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | ----------------------------- | ----------- |
| (අ) | සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ ප්‍රතිපාදනවලින් ක්‍රියාත්මක කරන ලද කමත් ඉදිකිරීමේ උප ව්‍යාපෘති යටතේ වටිනාකම රු.16,731,899 කට ගිවිසුම් ගතවූ කොන්ත්‍රාත්කරුවන් අදාළ කාර්යය ඉටු කිරීම පැහැර හැර තිබූ අතර කොන්ත්‍රාකරුවන් 03 දෙනෙකු වෙනුවෙන් ගෙවා තිබූ වැඩ ආරම්භ | අදාළ කොන්ත්‍රාත්කාර ආයතනය අමතා රාජ්‍ය මුදල් අවභාවිතය පිළිබඳ දැනුවත් කර ඇත. 2023/12/06 රු.500,000 ක මුදලක් ආපසු ගෙවීම්කර තිබුණද, | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |

| | | |
|---|---|---|
| කිරීමේ අත්තිකාරම් 03 ක එකතු වටිනාකම රු.3,575,068 ක් ආපසු අයකරගත නොහැකිවී තිබුණි. එම කොන්ත්‍රාත් වෙනුවෙන් ලබාගත් රු.3,575,068ක අත්තිකාරම් බැඳුම්කර සහ රු.462,281ක කාර්යසාධන බැඳුම්කර කාලය ඉකුත් වීමට පෙර මුදල් කරගෙන ප්‍රසම්පාදන අස්ථිත්වයට සිදුවූ පාඩුව පියවාගෙන නොතිබුණි. | නිසි පරිදි ආපසු ගෙවීම් නොකරන්නේ නම් නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බව දැනුවත් කර ඇත. | |

### 1.5.7 ශීර්ෂය 621 - පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළ අනුමත තාක්ෂණික නිළධාරීන් 68 දෙනෙකු පසුගිය වසර 02 පුරාම පුරප්පාඩුව පැවතුණි. | රජය විසින් ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණයක් මත සියළු බඳවා ගැනීම් නතර කරන ලද අතර ඒ අනුව කෘෂිකර්ම නිලධාරින් 68 ක් පුරප්පාඩු සඳහා බඳවාගැනීම් ද සිදු කර නොමැත. | සේවා අවශ්‍යතා වෙනුවෙන් අත්‍යාවශ්‍ය බඳවාගැනීම් සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගෙන පුරප්පාඩු සම්පූර්ණ කළ යුතුය. |

### 1.5.8 ශීර්ෂය 622- පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට සෙවිලි තහඩු මිලදී ගැනීමට පැවති ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී අවම මිල ගණන් ඉදිරිපත් කරන ලද සුදුසුකම් ලත් ආයතනය අදාළ සෙවිලි තහඩු නිෂ්පාදන ආයතනය වූ අතර, එම ආයතනයේ අවම මිල වූ රු.2,116,687 ක මිල ප්‍රතික්ෂේප කර එම නිෂ්පාදන ආයතනයේ නියෝජිත වෙළඳ ආයතනයක් ඉදිරිපත් කළ ඊළඟ මිල වූ රු.2,503,202 කට ටෙන්ඩරය පිරිනැමීම හේතුවෙන් රු.386,515 ක අලාභයක් සිදුවී තිබුණි. | සාරාණුකූලව ප්‍රතිචාර දක්වා ඇති අවම ලංසුකරු වෙත ලංසුව ප්‍රදානය කිරීම ප්‍රසම්පාදනයේ වගකීම වේ. එබැවින් අවම මිලගණන් ඉදිරිපත් කර තිබුණද, සාරාණුකූලව ප්‍රතිචාර දක්වා නොතිබීම හේතුවෙන් විගණනය විසින් දක්වා ඇති ලංසුව ප්‍රතික්ෂේප කර ඇති බවත්, රජයට පාඩුවක් සිදුව නොමැති බවත් දන්වමි. | තාක්ෂණික ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටු සාමාජිකයින්ගෙන් අලාභ අය කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අනුමත ගාස්තුව අනුව එක් කෘත්‍රිම සිංචන සේවාවක් සඳහා රු.350 ක් බැගින් ගාස්තු අයකළ හැකි වුවද, සමාලෝචිත වර්ෂයේදී නියැදි පරීක්ෂණයට භාජනය කරන ලද පශු වෛද්‍ය කොට්ඨාශ 06 ක අවස්ථාවන් 2,187 කදී එක් කෘත්‍රිම සිංචනයන් සඳහා රු.500 සිට රු.1,000 දක්වා අයකිරීම නිසා රු.857,550 ක් වැඩිපුර ගොවීන්ගෙන් අයකර තිබුණි. | මේ පිළිබඳව පරීක්ෂා කිරීමට කමිටුවක් පත් කිරීම සඳහා ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බව දන්වමි. එමගින් කෘතිම සිංචන සඳහා ගොවීන්ගෙන් වැඩිපුර මුදල් අය කර ඇති බවට අනාවරණය වුවහොත් එම මුදල් අදාළ නිළධාරීන්ගෙන් නැවත රජයට අය කර ගැනීමට කටයුතු කරමි. | අනුමත ගාස්තුව යටතේ අදාළ සේවා සැපයිය යුතුයි. |
| (ඇ) | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ 2021 වර්ෂය තුළ රු.6,791,213 ක් වියදම් දරා සත්ත්ව ගොවිපල තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් ස්ථාපිත කර තිබූ නමුත්, තොරතුරු පද්ධතියට දත්ත ඇතුළත් කර සම්පූර්ණ නොකිරීම හේතුවෙන් අදාළ ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි. | පශු වෛද්‍ය කාර්යාලවල සිටින කාර්යය මණ්ඩලය සීමා සහිත බැවින්ද මෙම සියළුම කටයුතු පශු වෛද්‍ය නිලධාරීන්ටම සිදු කිරීමට වීම හේතුවෙන්ද කටයුතු මන්දගාමී වී ඇත. | අපේක්ෂිත අරමුණු ඉටුවන ආකාරයට ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුයි. |

### 1.5.9 ශීර්ෂය 631- පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පූර්ව වකුගඩු රෝග පරීක්ෂාවන්ට අදාළ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ විශේෂ දත්ත සැකසුම් මෘදුකාංග (LIS) පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා එකතු වූ වටිනාකම රු.3,000,000 ක් වූ Laptop පරිගණක 12 ක්, මුද්‍රණ යන්ත්‍ර 12 ක් සහ ඊට අදාළ උපාංග සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල 12 ක් වෙත ලබා දී වසර 05 | පිළිතුරක් ඉදිරිපත් කර නොමැත. | දත්ත සැකසුම් පද්ධතිය ස්ථාපිත කර සේවා කාර්යක්ෂම කිරීමට කටයුතු කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | කට ආසන්න කාලයක් ගත වී ඇතත්, එම දත්ත සැකසුම් පද්ධතිය ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) | අනුරාධපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා බල ප්‍රදේශයේ ප්‍රතිලාභීන් වෙත බෙදා දීම සඳහා ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමෙන් ලැබුණු වටිනාකම රු.26,065,432 ක් වූ ත්‍රිපෝෂවලින් වටිනාකම රු.1,094,657 ක් වූ ත්‍රිපෝෂ පැකට් 30 බැගින් අඩංගු මළු 77 ක් අස්ථානගත වී තිබූ අතර, රු.23,497,597 ක් වූ ත්‍රිපෝෂ පැකට් 30 ක් අඩංගු මළු 1750 ක් අනුරාධපුර දුම්රියපලේ දුම්රිය ගැල්තුළ (Wagon) මාස 02 කට වැඩි කාලයක් නිදහස් කර ගැනීමකින් තොරව රඳවා තැබීමට ඉඩ හැර තිබුණි. දුම්රිය මැදිරි තුළ ත්‍රිපෝෂ පැවති කාලය තුළ පැවති සෙල්සියස් අංශක 45 ක උෂ්ණත්වය තුළ ත්‍රිපෝෂවල ගුණාත්මකභාවය අඩුවීමේ අවධානමක් පැවතුණි. වටිනාකම රු.26,065,432 ක් වූ ත්‍රිපෝෂ තොගය ප්‍රතිලාභීන් වෙත ලැබෙන විට කල් ඉකුත්වීමට ආසන්නව පැවතුණි. මෙම ත්‍රිපෝෂ තොග නියමිත කාලය තුළ දුම්රිය ගැල්වලින් ඉවත් කර නොගැනීම නිසා ප්‍රමාද ගාස්තු ලෙස රු.1,080,000 ක මුදලක් දුම්රිය දෙපාර්තමේන්තුවට ගෙවීමට සිදු වී තිබූ බව නිරීක්ෂණය විය. | විගණනය විසින් පෙන්වා දීමෙන් පසු ඒ සම්බන්ධයෙන් පැවති අභ්‍යන්තර පාලන වැඩ පිළිවෙල නිවැරදි කොට ශක්තිමත් කිරීම සිදු කරන ලදි. | සෞඛ්‍ය අමාත්‍යාංශයේ මාර්ගෝපදේශයන් අනුව කටයුතු කළ යුතුයි. |
| (ඇ) | ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය යටතේ වියපැහැදම් සබැඳි දර්ශක (DLI) අංක 08 අනුව වයස අවුරුදු 35-45 ත් අතර මුළු කාන්තා ජනගහනය ආවරණය වන පරිදි ගැබ්ගෙල පිළිකා පරීක්ෂණ සිදු කළ යුතු වුවත්, 2022 වර්ෂයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල 15 ක සිදු කළ නියැදි පරීක්ෂාවට අනුව වයස අවුරුදු 35-45 ත් අතර වූ මුළු ජනගහනයෙන් ගැබ්ගෙල පිළිකා පරීක්ෂා | මෙම ව්‍යාපෘතියේ වියපැහැදම් දර්ශකය අනුව කටයුතු ක්‍රමයෙන් සිදුවන බව දන්වමි. | ප්‍රාථමික සෞඛ්‍ය සේවා බල ගැන්වීමේ ව්‍යාපෘතියේ මාර්ගොපදේශ අනුව කටයුතු කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | කර තිබූ ප්‍රතිශතයේ පරාසය සියයට 05-36 ක් විය. ඒ අනුව ව්‍යාපෘතියේ වියපැහැදුම් සබැඳි දර්ශක (DLI) අංක ඉතා පහළ මට්ටමක පැවතීම තුළ ව්‍යාපෘතියේ ඉලක්කගත අරමුණු සම්පූර්ණ වී නොතිබෙන බව නිරීක්ෂණය විය. | | |
| (ඇ) | පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් රුධිර සාම්පල් පරීක්ෂා කිරීම සඳහා මිලදී ගෙන තිබූ රු.2,315,250 ක් වටිනා Serum Creatinine Pack 42 ක් කල් ඉකුත්වීමට ආසන්න වීම මත 2020 අප්‍රේල් 29 දින සැපයුම් ආයතන වෙත ආපසු යවා තිබුණි. විගණිත දින වූ 2024 මාර්තු 07 දින වන විට වසර 05 කට ආසන්න කාලයක් ගත වී ඇතත් එම රසායනික උපකාරක ද්‍රව්‍ය වෙනුවෙන් සැපයුම් ආයතන වෙත ගෙවූ මුදල හෝ නව Serum Creatinine Pack 42 ක ප්‍රමාණයක් ලබා ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබිණි. | අනුරාධපුර මධ්‍යම රසායනාගාරය තුළ සිදු කරනු ලබන පරීක්ෂණ පහළ මට්ටමක පැවතීම නිසා කල් ඉකුත් වීමට ආසන්නව තිබූ Serum Creatinine pack 42 ආපසු යවන ලදි. ඉන් පසුව එම pack සඳහා අවශ්‍ය පරිදි එම ආයතන විසින් මේ වන විට කොටසක් ලබා දී ඇති අතර ඉතිරි ප්‍රමාණය අවශ්‍යතාවය පරිදි ඉල්ලූ කර ලබා ගැනීමට කටයුතු කරනු ලබයි. | අවශ්‍යතාවය අනුව කඩිනමින් ලබාගෙන රෝහල් සේවා සඳහා සැපයිය යුතුයි. |
| (ඉ) | ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ මග පෙන්වීම මත පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ තෝරා ගත් රෝහල්වල බාහිර රෝගී අංශ ජාලගත කිරීමේ තාක්ෂණික ව්‍යාපෘතිය අනුරාධපුර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කිරීම සඳහා 2012 වර්ෂයේදී ප්‍රාදේශීය රෝහල් 02 ක් වෙත වටිනාකම රු.5,574,780 ක් වූ පරිගණක උපාංග ද, 2018 වර්ෂයේදී තවත් මූලික රෝහල් 03 ක් එකතුවෙන් වටිනාකම රු.3,107,897 ක් වූ පරිගණක උපාංග ලෙස එකතු වටිනාකම රු.8,682,677 ක උපකරණ වසර 05 කට වැඩි කාලයක් නිෂ්කාර්යව පැවතීම හේතුවෙන් ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි. | රේඛීය අමාත්‍යාංශයේ ඉල්ලීම, මග පෙන්වීම හා ප්‍රතිපාදන මත මෙම තෝරාගත් රෝහල්වල බාහිර රෝගී අංශ ජාලගත කිරීමේ තාක්ෂණික ව්‍යාපෘතිය අනුරාධපුර දිස්ත්‍රික්කයේ 2012 වර්ෂයේ දී හා 2019 වර්ෂයේ දී ක්‍රියාත්මක කළ නමුත් නිසි ශක්‍යතා අධ්‍යනයකින් තොරව එම ආයතනවල ක්‍රියාත්මක කිරීම නිසා ප්‍රායෝගිකව පැවති විවිධ ගැටළු මත මෙම ව්‍යාපෘතිය | ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| | | අපේක්ෂිත අරමුණු ඉටු වී නොමැති බව පිළිගනිමි. | |
| (ඊ) | තඹුත්තේගම මූලික රෝහල සඳහා ලැපරස්කොපි (Laparoscopy) යන්ත්‍රයක් මිලදී ගැනීමට 2022, 2023 වර්ෂවලදී ප්‍රතිපාදන වෙන් කර තිබු නමුත් එම යන්ත්‍රය මිලදී ගැනීම 2024 ජුනි 30 දින වන විටත් සිදු කර නොතිබීම හේතුවෙන් රෝගී සත්කාර සේවාවේ කාර්යය සාධනය ඉහළ නැංවීමට තිබු අවස්ථාව එමගින් අහිමි වි තිබුණි. | මෙම යන්ත්‍රය මිලදී ගැනීම සඳහා පත් කරන ලද තාක්ෂණික කමිටුව නිර්දේශ කරන ලද යන්ත්‍රයේ මිල, ලංසු ඉදිරිපත් කරන ලද අවම මිල ඉදිරිපත් කර තිබු ලංසුකරුගේ මිලට වඩා ප්‍රමාණාත්මක වැඩි වටිනාකමක් වීම හේතුවෙන් ආණ්ඩුකාරතුමාගේ උපදෙස් පරිදි යන්ත්‍රය මිලදී ගැනීම අත්හිටුවා නැවත ප්‍රසම්පාදන කටයුතු සිදු කිරිමට තීරණය කරන ලදි. | අදාළ යන්ත්‍රය කඩිනමින් සපයා දීමට කටයුතු කළ යුතුය. |

### 1.5.10 ශීර්ෂය 632- පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | උතුරු මැද පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවට අයත් වපසරිය අක්කර 30.55 ක් වූ ඔසු උයන් 13 සංවර්ධනය නොකිරීම නිසා වාර්ෂිකව වියළි ඖෂධ අවශ්‍යතාවයෙන් 95% ක් හාහිර සැපයුම්කරුවන්ගෙන් මිල දී ගෙන තිබුණි | උතුරු මැද පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතේ පවතින ඔසු උයන් තුලින් ඖෂධ නිෂ්පාදනයට අමුද්‍රව්‍ය සපයා ගැනීම එකම අරමුණ නොවන අතර, ඖෂධ සම්බන්ධයෙන් පාසල් දරුවන්ට අවශ්‍ය අධ්‍යාපනික දැනුම ලබාදීම මගින් දුර්ලභ ඖෂධ | ඔසු උයන් පිටුවීමේ අරමුණු ඉටුකර ගැනීම සඳහා කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | | සංරක්ෂණය කෙරෙහි ප්‍රජාවගේ දායකත්වය ලබාගැනීමද වේ. | |
| (ආ) | අනුරාධපුර පළාත් ආයුර්වේද රෝහලේ භාහිර රෝගී අංශ ප්‍රතිකාර සඳහා විකල්ප ඖෂධ නොමැති අත්‍යාවශ්‍ය නිම් ඖෂධ ප්‍රමාණවත් පරිදි මිලදී නොගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ විකල්ප නොමැති අත්‍යාවශ්‍ය ඖෂධ වර්ග 05 ක් සමාලෝචිත වර්ෂය තුළ දින 05 සිට දින 14 දක්වා කාලයක් පමණක් රෝගීන් වෙත එම ඖෂධ නිකුත් කර තිබු අතර එක් ඖෂධයක් කිසිදු දිනයකදී නිකුත් කර නොතිබුණි. 2023 වර්ෂයේ ඖෂධ මිලදී ගැනීම සඳහා රු.මිලියන 90 ක් වෙන්කළ තිබූ නමුත් ඉන් නිම් ඖෂධ මිලදී ගැනීම සඳහා වැය කර තිබූණේ රු.මිලියන 43 ක් පමණි. | 2023 වර්ෂයේදී ක්ෂණිකව වියළි ඖෂධ වල හා නිම් ඖෂධ වල මිල ගණන් ඉතා සීග්‍ර ලෙස ඉහළ යන ලද අතර ඒ තුලින් මිලදී ගත හැකි වූයේ අවශ්‍යතාවලින් හරි අඩක් වැනි ප්‍රමාණයකි | අත්‍යාවශ්‍ය ඖෂධ මිලදී ගැනීම සඳහා ප්‍රමුඛත්වය ලබාදිය යුතුයි. |

**1.5.11 ශීර්ෂය - 634 සමාජ සේවා දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | ------------------------- | ------------------ |
| (අ) | පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ පවතින වටිනාකම රු.2,833,013 ක් වූ කැකිරාව ඔළුකරද විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ගේ රැකවරණ මධ්‍යස්ථානය 2020 පෙබරවාරි 08 දින සිට විගණිත දින වූ 2024 පෙබරවාරි 10 දින වනතුරුත් භාවිතයට ගෙන නොතිබුණි. | කැකිරාව ඔළුකරද විශේෂ පුහුණු මධ්‍යස්ථානය සඳහා “ සවිත්මා” නමින් ව්‍යාපෘති වාර්තාවක් සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කර ඇති අතර ඒ පිළිබදව නැවත අවධානය යොමු කර ඉතා කඩිනමින් ඵලදායි ලෙස භාවිතයට ගැනීමට කටයුතු කරමි. | යෝජිත ව්‍යාපෘති කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ යටතේ රැකවරණය ලබන ආබාධිත ළමුන් පුහුණු කිරීම සඳහා පිහිටුවා ඇති තක්සේරු වටිනාකම රුපියල් මිලියන 06 ක් ඉක්ම වූ ගිරිතලේ අත්වැල පුහුණු මධ්‍යස්ථානය වසර 08 ක පමණ කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි. | මෙම ආයතනය ඉදිරියේ දී ගෙවීම් පහසුකම් සහිත වැඩිහිටි නිවාසයක් ලෙසින් පවත්වාගෙන යාමට අවශ්‍ය යෝජනා ඉදිරිපත් කර සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් සමඟ සාකච්ඡා ද පවත්වා ඇති අතර එය ඉතා කඩිනමින් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමි. | අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා සුදුසු වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුයි. |

**1.5.12 ශීර්ෂය - 640 පළාත් සමූපකාර,වෙළඳ හා ආහාර, ප්‍රවාහන ක්‍රීඩා හා යෞවන කටයුතු සහ කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහන සඳහා රුපියල් මිලියන 43 ක් ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් උතුරු මැද පළාත් සමූපකාර දෙපාර්තමේන්තුව වෙත ලබාදී තිබූ අතර එම මුදලින් සී/ස අනුරාධපුර දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයින්ගේ සමූපකාර සමිතිය වෙත 2021 වර්ෂයේදී ලබාදී තිබුණු රු. මිලියන 33 ක ණය මුදලින් 2024 පෙබරවාරි 26 දින වන විට රු.මිලියන 27.65 ක් ආපසු අයකරගෙන නොතිබුණි. එම සමිතියෙන් අයවිය යුතු ණය මුදල් අයනොවීම හේතුවෙන් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ණය ලබාදීමේ කටයුතු නවතා ඉතිරි මුදල් රු.මිලියන 15.35 ක් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබීම හේතුවෙන් උක්ත වැඩසටහනේ අරමුණ වූ "විවෘත වෙළඳපොල තුළ සහල් හිඟයක් ඇතිවීම වැළැක්වීම සහ සහල් මිල පාලනය" යන අරමුණු ඉටු වී නොතිබුණි. | ගිවිසුම් ප්‍රකාරව නියමිත කාලවලදී එකී මුදල් පියවිය යුතු නමුත් එසේ සිදු කර නැත. දැනට මෙම සහල් සමූපකාර සමිතිය ක්‍රියාකාරි තත්වයෙන් පවතින අතර ඔවුන්ගේ අත රැඳි මුදල් වලින් අදාළ වී මිලදී ගැනීමේ ක්‍රියාවලිය නොකඩවා සිදුකරනු ලබන අතර දෙපාර්තමේන්තුව විසින් ලබා නොදුන් මුදල සමස්ත සහල් හිඟයක් හෝ මිල පාලනය යන කරුණු සඳහා බලපෑමක් ඇති නොවේ. | චක්‍රීය ණය වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කළ යුතුයි. |

### 1.5.13 සමුපකාර සේවක විශ්‍රාම වැටුප් අරමුදල

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | -------------------------------- | ------------ |
| (අ) | සමුපකාර සේවක විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට අදාළව සමාලෝචිත වර්ෂය හා ඉකුත් වසර දෙකකට අයත් ගෙවිය යුතු විශ්‍රාම වැටුප් අදාළ කාලය තුළ ගෙවා නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විටද රු.27,223,075 ක් ගෙවිය යුතුව තිබුණි. | විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා ප්‍රමාණවත් පරිදි මුදල් ලැබීමක් නොමැති හෙයින් ක්‍රමානුකූලව මාසික විශ්‍රාම වැටුප් ගෙවීමට නොහැකි වී ඇත. | යෝජනා ක්‍රමයෙහි පවතින එකඟතාවන්ට අනුව ප්‍රතිලාභීන්ට ගෙවීම් කළ යුතුයි. |
| (ආ) | සමුපකාර සේවක විශ්‍රාම වැටුප් ගිණුමට අදාළව 2011 සිට 2021 දක්වා කාලය තුළ තැන්පත් කළ වටිනාකම රු.1,888,739 ක් වූ චෙක්පත් 82 ක් උපලබ්ධි වී නොතිබුණු අතර ඒ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන සහ ගිණුම් කටයුතු ප්‍රමාදවීම හේතුවෙන් හඳුනාගත නොහැකි විය. කඩිනමින් නිවැරදි කිරීමට කටයුතු කරමි. | බැංකුව වෙත තැන්පත් කරනු ලබන චෙක්පත් පිළිබඳ නිරන්තර අවධානයෙන් සිට අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුයි. |

### 1.5.14 උතුරු මැද පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරිය

| විගණන නිරීක්ෂණය | ආයතනයේ සභාපතිගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| ------------------------- | ------------------------- | ------------------ |
| කැකිරාව බස්නැවතුම්පොළෙහි කඩ කාමර 12 ක මාසික බදු කුලිය තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2023 ජුනි මාසයේ තක්සේරු කර ලබාදී ඇතත්, එම තක්සේරු වටිනාකම මත මාසික බදු කුලිය අය කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අවසාන වන විට මසකට රු.129,000 බැගින් එම කඩ කාමර 12 න් රු.774,000 ක ආදායමක් අධිකාරියට අහිමි වී තිබුණි. | කඩහිමියන් 9 දෙනෙක් තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද නව ඇස්තමේන්තු ගත මුදල බදු වශයෙන් ලබා ගැනීමට ප්‍රතික්ෂේප කර ඇත. මේ පිළිබඳ ඔවුන් විසින් ගරු ආණ්ඩුකාරතුමා වෙත බදු මුදල සංශෝධනය කර සහනයක් ලබා දෙන ලෙස ඉල්ලා ඇත. නව බදු ගිවිසුම් ලබා දීමේදී පොදු මිලක් තීරණය කිරීමට ඉදිරියේ දි කටයුතු කරමි. | අධිකාරියට අයත් කඩකුලී ආදායම් තහවුරු කර ගැනීම සඳහා වැඩ පිළිවෙලක් කඩිනමින් සැකසිය යුතුයි. |

**1.5.15 ශීර්ෂය 641- පළාත් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | ------------------------- | ------------------ |
| (අ) | 2009 අංක 05 දරන සමූපකාර ප්‍රඥප්තියේ 58 (3) වගන්තිය ප්‍රකාරව බේරුම්කරුවන්ගේ තීන්දුවෙන් අතෘප්තියට පත් යම් පාර්ශවකරුවන් විසින් සමාලෝචිත වර්ෂය අවසන්වන විට ඉදිරිපත් කර තිබුණු අභියාචනා 61 න්, අභියාචනා 07 ක් පමණක් නිම කර තිබුණු අතර අභියාචනා 54 ක් සම්බන්ධයෙන් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. මෙම අභියාචනා සම්බන්ධයෙන් අභියාචනාකරුවන් විසින් රු.1,703,482 ක මුදල් තැන්පත් කර තිබුණි. | කරුණු ඉදිරිපත් කරන පිළිවෙල අනුව අභියාචනා විභාග කරනු ලබන අතර 2024.12.31 දින වන විට මෙකී අභියාචනා විභාග කිරීම අවසන් කිරීමට බලාපොරොත්තු වෙමි | සමූපකාර සංවර්ධන ප්‍රඥප්තිය අනුව කටයුතු කළ යුතුයි. |
| (ආ) | උතුරුමැද පළාත තුළ ලියාපදිංචි සමූපකාර සමිති 723 කින් සමූපකාර සමිති 373 ක් අක්‍රිය තත්ත්වයේ පැවති අතර අක්‍රිය සමූපකාර සමිති සම්බන්ධයෙන් 2009 අංක 05 දරන උතුරු මැද පළාත් සමූපකාර ප්‍රඥප්තියේ XI වන පරිච්ඡේදයේ දක්වා ඇති විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අක්‍රිය සමිති සඳහා සමූපකාර සමිති ප්‍රඥප්තියේ 50 වගන්තිය ප්‍රකාරව භාරකරුවන් පත්කිරීමට කටයුතු කර ඇත. සමිති 120 කට අදාළ තොරතුරු මෙම කාර්යාලය වෙත ලැබී ඇත. ඉන්පසු මෙම සමිති සම්බන්ධයෙන් සමූපකාර සමිති ප්‍රඥප්තිය ප්‍රකාරව ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ. | ප්‍රඥප්තිය ප්‍රකාරව කටයුතු කඩිනමින් අවසන් කළ යුතුයි. |
| (ඇ) | 2009 අංක 05 දරන උතුරු මැද පළාත් සමූපකාර ප්‍රඥප්තියේ 44 වන වගන්තිය ප්‍රකාරව සෑම ලියාපදිංචි කළ සමිතියක් විසින්ම තම සමිතියේ මූලා ප්‍රකාශන මුදල් වර්ෂය අවසාන වී මාස 03 ක් ඇතුළත රෙජිස්ට්‍රාර්වරයා හෝ ඔහු විසින් බලය දෙන ලද වෙනත් තැනැත්තෙක් වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, අනුරාධපුර දිස්ත්‍රික්කයේ සමූපකාර සමිති 62 ක ගිණුම් 105 | මෙම සමූපකාර සමිති අතුරින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ සණස සමිති 45 ක් වෙතින් ගිණුම් 66 ක් හා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සණස සමූපකාර සමිති 17 කට අදාළ ගිණුම් 39 තොරතුරු | ප්‍රඥප්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | ක් 2024 පෙබරවාරි 29 දින වන විටත් විගණනය සඳහා සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි. | අදාළ සමිති භාර සංවර්ධන නිළධාරින් වෙත යොමු කර ඇති අතර එකී ගිණුම් හැකි ඉක්මනින් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලෙස දැනුම් දී ඇත. | |
| (ඈ) | සමුපකාර රෙජිස්ට්‍රාර්වරයා වෙත විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සමුපකාර සමිති 22 ක ගිණුම් 25 ක් 2024 පෙබරවාරි 29 දින වන විටත් විගණනයන් ආරම්භ කර නොතිබුණු අතර සමිති 49 ක ගිණුම් 57 ක විගණන කටයුතු අවසන් කර වාර්තා ඉදිරිපත් කර නොතිබුණි | මේ වන විට අදාළ ගිණුම් පරීක්ෂා කිරිමේ කටයුතු සිදුකරනු ලබන අතර එහි අඩුපාඩු අදාළ සමිති වෙත දැනුම් දීමට කටයුතු කර නිවැරදි කිරීමට කටයුතු කරමි. | කඩිනමින් විගණනය අවසන්කර වාර්තා ඉදිරිපත් කළ යුතුයි. |
| (ඉ) | සමුපකාර සංවර්ධන අරමුදලට අදාළව 1997 සිට 2022 දක්වා කාලය තුළ තැන්පත් කළ වටිනාකම රු.1,468,669 ක් වූ චෙක් පත් 71 ක් උපලබ්ධි වී නොතිබුණි. | මෙම අරමුදලේ බැංකු සැසඳුම් ප්‍රකාශ ප්‍රමාද වී සකස් කර ඇති හෙයින් එකී තැන්පත් කල නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් හඳුනාගැනීමට නොහැකි විය. ඉදිරියේදී චෙක්පත් හඳුනාගැනීමට කටයුතු කරමි. | බැංකුව වෙත තැන්පත් කරනු ලබන චෙක්පත් පිළිබඳ නිරන්තර අවධානයෙන් සිට අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුයි. |
| (ඊ) | 2021 වර්ෂයේ විශේෂ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ රු.6,550,843 ක් වැයකර ඉදිකිරීම් නිමකර අදාළ සමුපකාර සමිති වෙත භාරදුන් සමුපකාර සමිති 05 කට අයත් ගොඩනැගිලි 05 ක් විගණිත දින වන 2023.02.14 විටද වර්ෂ 02 කට අධික කාලයක් කිසිඳු ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතීමට ඉඩහැර තිබුණි. | පිළිතුරු දී නැත. | අපේක්ෂිත අරමුණු ඉටුකරගත යුතුයි. |

**1.5.16 ශීර්ෂය 642- පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව සතුව පවතින කඩ කාමර හා වෙළඳ කුටි 27 කින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වර්ෂයකට වඩා පැරණි රු.1,760,861 ක හිඟ කඩකුලී ශේෂයක් අය නොවී පැවතුණි. සමාලෝචිත වර්ෂය අවසානය වන විට කඩ කාමර 10 ක ගිවිසුම් කාලය අවසන් වී තිබුණි. | කඩ හිමියන් විසින් කුලී ගෙවීම අපහසු බව දන්වා ගරු ආණ්ඩුකාරතුමාට අභියාචනා ඉදිරිපත් කර ඇත. | ගිවිසුම් යාවත්කාලීන කර කඩිනමින් හිඟ කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුයි. |
| (ආ) | පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තු අලෙවි සංකීර්ණය සතු කඩ කාමර හා අලෙවි කුටි 11 ක් 2023 දෙසැම්බර් 31 දින වන විට වසර 02 ත් වසර 05 ත් අතර කාලයක් වසා දමා තිබුණි. | මේ වන විට නිෂ්කාර්යව පවතින කඩ කාමර ටෙන්ඩර් මගින් වෙනත් බදුකරුවන්ට ලබාදීමට කටයුතු කරමි. | උනන්දුවක් දක්වන ව්‍යවසායකයින්ට කඩ කාමර ලබාදිය යුතුයි. |
| (ඇ) | පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ඇති සෙලෙස්තිමඩුව වඩු පුහුණු පාසලේ නේවාසිකාගාරය 2021 වර්ෂයේදී රු.2,941,275 ක වැය දරා ඉදිකර තිබූ අතර, එම වර්ෂයේ සිට මේ දක්වා කිසිවෙකුත් නේවාසික පහසුකම් ලබාගෙන නොමැති වීමෙන් එය නිෂ්කාර්ය වියදමක් බව නිරීක්ෂණය විය. | 2023 වර්ෂයේ ආධුනික පුහුණුකරුවන් බඳවා ගැනිම සඳහා කටයුතු කළද, එම වසරේ රට තුළ පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් ආධුනික පුහුණුකරුවන් නොපැමිණි අතර, මේ වන විට ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා වසම් මට්ටමින් දැනුවත් කිරීම් සිදු කර නව පුහුණුකරුවන් බඳවා ගැනිමට කටයුතු යොදා ඇත. | අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුයි. |

### 1.5.17 පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය

| | විගණන නිරීක්ෂණය | ආයතනයේ සභාපතිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | ------------------------- | ------------------ |
| (අ) | මරදන්කඩවල විධායක ඉංජිනේරු කාර්යාල පරිශ්‍රයේ ඉදිකර තිබූ යාන්ත්‍රික අංගනයේ කටයුතු ආරම්භ නොකර නවතා දැමීම හේතුවෙන් ඉදිකිරීම් හා උපකරණ මිලදී ගැනීමට දරන ලද රු.6,041,838 ක වියදම් නිෂ්කාර්ය වී තිබුණි. | ආණ්ඩුකාරතුමා සමඟ පැවති සාකච්ඡාවක තීරනයක් අනුව ක්‍රියාත්මක කළ නොහැකි විය. | අපේක්ෂිත අරමුණු සඳහා යෙදවිය යුතුයි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී සහ ඉකුත් වර්ෂවලදී මාර්ග නඩත්තු කටයුතු සඳහා මිලදී ගෙන ඇති රු.5,782,812 ක වටිනාකමක් සහිත අමුද්‍රව්‍ය වැඩ බිම් ආශ්‍රිතව වර්ෂ 01 – 03 ත් අතර කාල පරාසයක් අනාරක්ෂිත ලෙස ගබඩා කර තිබූ අතර ඉන් රු.274,403 වටිනාකමක් සහිත අමුද්‍රව්‍ය අස්ථාන ගතවී තිබූ අතර රු.1,758,951 වටිනාකමක් සහිත අමුද්‍රව්‍ය භාවිතයට ගත නොහැකි ලෙස විනාශ වෙමින් පැවතුණි. | මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති තොරතුරු නිශ්චිත හා ප්‍රමාණවත් නොවන බැවින් පිළිතුරු ලබාදීම අපහසුය. | මාර්ග නඩත්තු සඳහා අමුද්‍රව්‍ය මිලදී ගැනීම, භාවිතය සහ ගිණුම්ගත කිරීම පිළිබඳ ශක්තිමත් අභ්‍යන්තර පාලන ක්‍රමයක් ඇති කළ යුතුය. |

### 1.5.18 ශීර්ෂය 651 පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | ------------------------- | ------------------ |
| (අ) | පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වැව් ප්‍රතිසංස්කරණය කිරීමේදී, ඊට අවශ්‍ය පස් හා බොරළු ප්‍රවාහනය සඳහා අදාළ වැඩබිම සහ පස් ලබා ගන්නා ස්ථාන ලෙස ඇස්තමේන්තුවට ඇතුළත් කර තිබූ දුර ප්‍රමාණයන් ගෙවීම් කිරීමේදී වැඩි කර දක්වා අමතර වැඩ ලෙස ගෙවීම් කිරීම නිසා නියැදි පරීක්ෂාවට භාජනය කරන ලද වැව් 02 ක සඳහා රු.612,620 ක් වැඩිපුර ගෙවා තිබුණි. | බොරළු වලවල් වැඩ බිම ආසන්නයේ ඉදිකිරීම් සිදුකරන කාල වකවානුවේදී සොයාගැනීමට නොහැකිවීමත් කිලෝමීටර් 30-60 ත් දුරින් බොරළු සපයාගත් බවට කාර්මික නිලධාරි හා ඉංජිනේරු විසින් මිල විශ්ලේෂණ වාර්තාවේ නිර්දේශකර ඇත. | මූලික ඇස්තමේන්තු කිරීමේදී බොරලු ලබාගන්නා ස්ථාන නිශ්චිතව හඳුනාගෙන තරඟකාරී මිල ගණන් ලබා ගැනීමේ වාසිය පළාත් සභා අරමුදලට ලබාගත යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වැව් හා අනෙකුත් ඉදිකිරීම් 03 කට අදාළව ගෙවීම් කිරීමේදී විවිධ හේතූන් මත ඉටු නොකළ වැඩ කොටස් සඳහා රු.1,143,636 ක් වැඩිපුර ගෙවා තිබුණි. | ලබාගත් මිනුම් අනුව අවසන් බිල්පතේ වටිනාකම් ගෙවා ඇත. | සාවද්‍යා මිනුම් මත සිදුකළ වැඩිපුර ගෙවීම් අදාළ නිර්දේශයන් ලබාදුන් නිලධාරීන්ගෙන් අයකළ යුතුවේ. |
| (ඇ) | වැව් ප්‍රතිසංස්කරණය කිරීමේදී වැව් බැම්මේ සහ ඉදිකිරීම් ස්ථානවල පවතින ඉදිකිරීම්වලට බාධාවන දැවමය වටිනාකම සහිත ගස් විධිමත් අනුමැතියක් සහිතව දැව සංස්ථාවට භාර දිය යුතු වුවත් වැව් 04 ක් ප්‍රතිසංස්කරණයේදී එසේ ඉවත්කළ වටිනා ගස් 168 ක් විධිමත් පරිදි දැව සංස්ථාව වෙත ලබාදුන් බවට හෝ ඒවා නීත්‍යානුකූලව භාවිත කළ හැකි වෙනත් කාර්යයන් සඳහා යොදාගත් බවට සාක්ෂි නොතිබුණි. | ඉවත් කිරීමට සිදුවන ගස් සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. | ඉවත් කරන ගස් විධිමත් පරිදි බැහැර කිරීම සඳහා අවශ්‍ය උපදෙස් හා චක්‍රලේඛ මඟින් අදාළ නිලධාරීන් දැනුවත් කර ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කළ යුතුයි. |

**1.5.19 ශීර්ෂය 652 පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------ | ------------------------ | ----------------- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාතේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 24 ට අදාළව දීර්ඝ කාලීන බලපත්‍ර හිමියන් 2,474 කගේ දීර්ඝ කාලීන ඉඩම් බලපත්‍ර ගාස්තු රු.398,069,896 ක් හිඟව පැවති අතර බදු ගෙවීම පැහැර හැර ඇති පුද්ගලයන් සම්බන්ධයෙන් 2022 සහ 2023 වර්ෂවලදී නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත්තේ පුද්ගලයින් 18 දෙනෙකු සඳහා පමණි. ඒ අනුව හිඟ ආදායම් අයකර ගැනීමට විධිමත් වැඩ පිළිවෙලක් පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව සතුව නොමැති බව නිරීක්ෂණය විය. | හිඟ බදු අයකර ගැනීමට කඩිනමින් වැඩ පිළිවෙලක් සකසා ඇත. | ඉඩම් කාර්යය සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | රජයේ ඉඩම් නේවාසික සහ ව්‍යාපාරික කටයුතු සඳහා දීර්ඝ කාලීන බදු පදනමට ලබා දීමේදී පවතින අකාර්යක්ෂමතාවය හා ප්‍රමාදය හේතුවෙන් පළාත් සභාවට ලැබිය යුතු ආදායමක් අහිමි වී තිබුණි. මේ සම්බන්ධයෙන් අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 11 ක සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂණයකට අනුව තක්සේරු වාර්තා ලබා ගැනීමට තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යැවූ ලිපි ගොනු 621 ක්, මැනුම් වාර්තා ලබා ගැනීමට මැනුම්පති වෙත යැවූ ලිපිගොනු 4 ක් හා අවසන් අනුමැතිය සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත යැවූ ලිපිගොනු 568 ක් ලෙස ලිපිගොනු 1193 ක් සඳහා අනුමැතිය ලැබීම වසර 2 සිට වසර 20 දක්වා ප්‍රමාද වී තිබුණි. | දීර්ඝ කාලීන බදු ගොනු යාවත්කාලීන කිරීම සඳහා කඩිනම් වැඩ පිළිවෙලක් සකස් කරමින් පවතී | ඉඩම් නියමානුකූල කිරීම හා බදු ආදායම් වැඩිකර ගැනීම සඳහා ප්‍රමාණවත් අවධානයක් යොමුකර කටයුතු කළ යුතුයි. |

**1.5.20 ශීර්ෂය - 660 ප්‍රධාන ලේකම් කාර්යාලය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | ------------------------- | ------------- |
| (අ) | මූලික විමර්ශනයක් පැවැත්වීම සඳහා නියෝගකරන බලධාරියකු විසින් ඒ ඒ සිදුවීමේ ස්වාභාවය සැලකිල්ලට ගනිමින් අවස්ථාවෝචිතව එම විමර්ශනය කොතරම් කාලයක් ඇතුළත නිමකළ යුතු ද යන්න විමර්ශනය සඳහා පත්කරන නිලධාරියාට දැන්විය යුතු වුවද, පළාත් සභාවේ අමාත්‍යාංශයක හා දෙපාර්තමේන්තු 07 ක පැවැත්වෙන මූලික විමර්ශන 117 ක් සඳහා නිශ්චිත කාලයක් ලබාදී නොතිබීම හේතුවෙන් එම මූලික විමර්ශන කටයුතු ආරම්භකර මාස 06 ත් වර්ෂ 08 ත් අතර කාලයක් ගතවී ඇතත් ඒවා අවසන් කර නොතිබුණි. | මූලික විමර්ශනය කඩිනමින් අවසන් කිරීමට උපදෙස් ලබාදෙමින් සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්/ දෙපාර්තමේන්තු ප්‍රධානීන් අමතා චක්‍රලේඛ ලිපියක් නිකුත් කර ඇත. | ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ 13.2 වගන්තිය ය අනුව නියමිත කාලය තුළ පරීක්ෂණය අවසන් කිරීමට කටයුතු කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි සහතිකය අනුව උතුරු මැද පළාත් සභාවට අයත් වාහන 19 ක් සහ යතුරුපැදි 10 ක් අස්ථානගතවී තිබුණි. | පැවැත්ම තහවුරු කළ නොහැකි වාහන සම්බන්ධයෙන් අදාළ ආයතන දැනුවත් කර ඇති අතර පිළිතුරු ලද පසු විගණනය වෙත දන්වන බව. | පළාත් සභාව නමින් ලියාපදිංචි වී ඇති එහෙත් භෞතිකව නොමැති වාහන සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකර අස්ථානගත වූ වාහන හඳුනාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුයි. |

**1.5.21 ශීර්ෂය - 661 පළාත් භාණ්ඩාගාරය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| පළාත් මූල්‍ය රීති 259.2 හා 259.3 පරිදි දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල වූ අග්‍රිම ශේෂයන් ඊළඟ වර්ෂයේ ජනවාරි 10 දිනට හෝ පළාත් භාණ්ඩාගාරය විසින් නියම කරනු ලබන දිනයක ආපසු පියවිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශ 02 ක් විසින් නිරවුල් නොකළ වසර 10 - 16 ත් අතර කාලයක සිට පැවත එන අග්‍රිම ශේෂයන්ගේ එකතුව රු.27,478,709 ක් විය . | ප්‍රධාන අමාත්‍යාංශයට අයත් රු.26,405,861 ක මුදල සම්බන්ධයෙන් පොදු දේපල පනත යටතේ කටයුතු කරන ලෙස අදාළ ආයතනය වෙත දැනුම් දී ඇති බවත් පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් රු.1,072,848 ක ශේෂ කොන්ත්‍රාත්කරු විසින් වැඩ කරගෙන යාමට නොහැකි වී වැඩ අතහැර දමා ගොස් තිබූ බැවින් අයකරගැනීමට නොහැකිව ඇත. | පළාත් මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |

**1.5.22 ශීර්ෂය - 663 පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
| --- | --- | --- |
| ------------------------- | ------------------------- | ------------------ |
| ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව රු.මිලියන 05 ට අඩු සහ කොන්ත්‍රාත් කාලය මාස 03 ට අඩු ඉදිකිරීමේ කොන්ත්‍රාත් සඳහා මිල විචලනයන් ගෙවීමට ඉඩ නොදිය යුතු වුවද ගිවිසුම්ගත වටිනාකම රු.4,705,162 ක් වූ කොන්ත්‍රාත් කාලය මාස 03 ට අඩු හොරිවිල වෙද ගෙදර නේවාසිකාගාරය ඉදි කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.835,581 ක මිල විචලනයන් ගෙවා තිබුණු අතර, එම ව්‍යාපෘතිය වෙනුවෙන් ගෙවීම් කිරීමේදී ඉටු නොකළ වැඩ වෙනුවෙන් සාවද්‍ය මිනුම් වාර්තා පදනම් කරගෙන රු.403,629 ක් වැඩිපුර ගෙවා තිබුණි. | තාක්ෂණික නිලධාරියාගේ මිනුම් ගැනීමේ දෝෂයක් හේතුවෙන් සිමෙන්ති ඇතුරුම වෙනුවෙන් දෙවරක් ගෙවීම් කටයුතු සිදුකර ඇත. එය කොන්ත්‍රාත්කරුට ගෙවීමට ඇති අත රැඳවුම් මුදල්වලින් අඩු කිරීමට කටයුතු කරන ලෙස කැකිරාව ප්‍රාදේශීය ඉංජිනේරුට උපදෙස් දී ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |

**1.5.23 ශීර්ෂය - 665 පළාත් ආදායම් දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
| --- | --- | --- | --- |
| | ------------------------- | ------------------------- | ------------------ |
| (අ) | උතුරු මැද පළාත තුළ පිහිටි ඉඩමකින් ඛණිජ ද්‍රව්‍ය කැණීම් කර ලබාගන්නා තැනැත්තන් විසින් ගෙවිය යුතු ඛණිජ බදු අයකර ගැනීම සඳහා පළාත් ආදායම් දෙපාර්තමේන්තුව සතුව 2022 සහ 2023 වර්ෂවලදී සක්‍රිය බදු ලිපිගොනු 90 ක් පමණක් පැවති අතර, ඛණිජ ද්‍රව්‍ය කැණීම් පිළිබඳ බලපත්‍ර ලබාදීමේ අයිතිය ඇති භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් 2022 සහ 2023 වර්ෂ සඳහා උතුරු මැද පළාතේ කලුගල් කැණීම් වෙනුවෙන් ඛණිජ කැණීම් බලපත්‍ර 813 ක් නිකුත්කර තිබුණි. | තොරතුරු කැඳවා ඇතත් මේ දක්වා තොරතුරු ලැබී නැත. ඉදිරියේ දී එම තොරතුරු ලබාගෙන ඉදිරි කටයුතු කරමි. | ඛණිජ බදු අයකිරීම සඳහා ඛණිජ ද්‍රව්‍ය නියාමන ආයතනවල දත්ත පාදකකර ගත යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අනුරාධපුර දිස්ත්‍රික්කයේ සක්‍රීය ඛණිජ බදු ලිපිගොනු 78 ක් අතුරින් සියයට 25 ක නියැදියක් පරීක්ෂණයට භාජනය කළ අතර, එම ගොනුවලින් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය රාජ්‍ය භාගය අයකළ කියුබ් ප්‍රමාණයෙන් සියයට 20 කට අඩු ප්‍රමාණයක් සඳහා පමණක් පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් ඛණිජ බදු අයකර තිබුණි. | භූ විද්‍යා පතල් කාර්යාංශයේ ලියාපදිංචියේදී 2022 වර්ෂයේ දී ලබා දී ඇති තොරතුරු වල අඩංගු ප්‍රමාණයක් අතර යම් නොගැලපීමක් ඇති බව දන්වා සිටිමි. භූ විද්‍යා හා පතල් කාර්යාංශයේ තොරතුරු අනුව රාජ්‍ය භාගය අය කර ගෙන ඇති ලිපිගොනු වලින් අයකළ යුතු බදු මුදල් වලින් 70% ක් මේ වනවිට අයකර ගැනීමට කටයුතු කර ඇත. ඉතිරි 30% අය කර ගැනීමේ කටයුතු 2024.06.30 වන විට නිම කිරීමට අපේක්ෂා කරමි. | ඛණිජ බදු අයකිරීම සඳහා ඛණිජ ද්‍රව්‍ය නියාමන ආයතනවල දත්ත පාදකකර ගත යුතුයි. |
| (ඇ) | භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ 2022 සහ 2023 වර්ෂවල වැලි කැණීම් සඳහා බලපත්‍ර 159 ක් නිකුත්කර තිබූ අතර, වැලි කැණීම් සඳහා බලපත්‍ර ලබාගත් එක් සමාගමක් පමණක් පළාත් ආදායම් දෙපාර්තමේන්තුව වෙත වැලි කැණීම් වෙනුවෙන් ඛණිජ බදු ගෙවා තිබුණි. ඒ අනුව වැලි කැණීම් සඳහා 2022 සහ 2023 වර්ෂවල බලපත්‍ර ලබාගත් බලපත්‍රලාභීන් 158 දෙනෙකුගෙන් එම කාලයට අදාළව රු.8,324,612 ක් ඛණිජ බදු පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2022 වර්ෂයට අදාළව වැලි කැනීම සඳහා බලපත්‍ර 189 ක් ද 2023 වර්ෂය සඳහා බලපත්‍ර 152 ක් ද ලබාදී ඇත. එම බලපත්‍ර සියල්ල ජී.එස්.එම්.බී.ටෙක්නිකල් සර්විස් (පුද්) සමාගමට වන අතර එම සමාගම සඳහා දෙපාර්තමේන්තුව සතුව ලිපිගොණුවක් පවතී. ඒ මඟින් බදු අය කිරීම සිදු කරනු ලැබේ. | භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කැණීම් කාර්යාංශය මගින් නිකුත් කළ බලපත්‍රවල සඳහන් ප්‍රමාණයට බදු අයකළ යුතුයි. |
| (ඈ) | පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ පළාත් ආදායම් සේවයේ තක්සේරුකරු සහ ජොෂ්ඨ තක්සේරුකරු තනතුරු විධායක ශ්‍රේණියේ III/II ලෙස ඇතුළත්වන පරිදි කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව තනතුර අනුමතකර | මේ සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට අභියාචනාවක් ඉදිරිපත් කර ඇත. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නිර්දේශ අනුව කටයුතු කළ යුතුයි. |

තිබියදී ඊට පටහැනිව තක්සේරුකරු සහ ජ්‍යෙෂ්ඨ තක්සේරුකරු තනතුරු II/I ලෙස ඇතුළත්කර පළාත් ආදායම් සේවා ව්‍යවස්ථාව අනුමතකර ක්‍රියාත්මක කිරීම හේතුවෙන් තක්සේරුකරු තනතුරේ නිලධාරීන් 04 දෙනෙකු වෙත 2015 අප්‍රේල් සිට 2022 සැප්තැම්බර් දක්වා රු.2,639,652 ක් වැඩිපුර වැටුප් හා දීමනා ගෙවා තිබුණි.